කො/දේවිබාලිකාවිද්‍යාලය - කොළඹ
පළමු වාරපරීක්ෂණය - 2016 (මාර්තු)

ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය- I

10 ශ්‍රේණිය

කාලය පැය 03 යි

❖ ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.

01) පහත දක්වා ඇති වුවමනා හා අවශ්‍යතා අනුපිළිවෙළින් ගැළපූ විට,

| | |
|---|---|
| 1. පරිගණක ක්‍රීඩා | A. සෞඛ්‍යය |
| 2. CCTV කැමරා | B. සන්නිවේදනය |
| 3. ගිලන් රථ | C. සන්නිවේදනය |
| 4. ජංගම දුරකථන | D. ආරක්ෂාව |

i. BCAD
ii. BDAC
iii. CDAB
iv. CBAD

02) මෝටර් රථ කාර්මික ශිල්පියකුගේ සේවය හා මෝටර් රථය නැමැති නිෂ්පාදිතය තුළ ඇති සමානතාවයකි.

1. භෞතික පැවැත්මක් නොමැති බව.
2. දෘෂ්‍ය බව
3. අවශ්‍යතා හා වුවමනා තෘප්තිමත් කිරීම.
4. අදෘෂ්‍ය බව

03) නිෂ්පාදන ක්‍රියාවලිය සඳහා යොදා ගන්නා වන සම්පත්, කළමනාකරුවන්, රථවාහන යනාදී නිෂ්පාදන සාධක පිළිවෙළින් අයත් වනුයේ,

1. ප්‍රාග්ධනය, ශ්‍රමය, භූමිය
2. භූමිය, ව්‍යවසායකත්වය, ප්‍රාග්ධනය
3. භූමිය, ශ්‍රමය, ප්‍රාග්ධනය
4. ප්‍රාග්ධනය, ව්‍යවසායකත්වය, භූමිය

04) පහත දක්වා ඇති ආයතන අතුරින් භාණ්ඩ නිෂ්පාදනය කිරීමේ නියැලී සිටින්නේ,

1. රක්ෂණ සංස්ථාව
2. දම්රෝ ආයතනය
3. හැටන් නැෂනල් බැංකුව
4. ආසිරි රෝහල

The National e-learning Portal for The General Education

05) ව්‍යවසායකයෙකු සිය නිෂ්පාදන කටයුතු තුළින් අපේක්ෂා කරනුයේ,

1. වැටුපකි
2. පොලියකි
3. පාඩුවකි / අලාභයකි
4. ලාභයකි

06) මෙය ව්‍යවසායකයකු සතු පුද්ගල ගති ලක්ෂණයක් නොවේ.

1. යහපත් ආකල්ප පැවතීම.
2. නිර්මාණශීලීත්වය
3. නිෂ්පාදන සම්පත් හැසිරවීම
4. නම්‍යශීලීත්වය

07) පහත දැක්වෙන සාධක අතුරින් ව්‍යාපාරයකට පාලනය කල හැකි සාධක හඳුනා ගන්න.

1. සේවක වැටුප් පිළිබඳ තීරණ
2. පාරිභෝගිකයන්ගේ ජීවන රටාව
3. තරඟකරුවන්ගේ නිෂ්පාදනවල මිල
4. සැපයුම්කරුවන් සපයනු ලබන අමුද්‍රව්‍යවල මිල

08) පහත දක්වා ඇති බාහිර පරිසරයන් හා ඒ තුළ අන්තර් ගත විචල්‍යයන් අනුපිළිවෙලින් ගැළපූ විට නිවැරදි පිළිතුර වනුයේ,

| I | II |
|---|---|
| 1. නෛතික පරිසරය | A. අයවැය ප්‍රතිපත්ති |
| 2. දේශපාලන පරිසරය | B. ආදායම් ව්‍යාප්ති |
| 3. ආර්ථික පරිසරය | C. පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය |

1. ABC
2. CAB
3. BAC
4. BCA

09) පරිසරයට හිතකර ලෙස ව්‍යාපාර කටයුතු සිදුකරන්නේ දැයි සොයා බැලීම ඇල්මැති පාර්ශවයකගේ අරමුණකි. එම පාර්ශවය කවුරුන්ද?

1. සැපයුම් කරුවන්
2. තරඟ කරුවන්
3. මූල්‍ය ආයතන
4. ප්‍රජාව

10) ව්‍යාපාරයක කළමනාකරුවකුගේ කාර්ය භාරයකි,

1. තීරණ ක්‍රියාත්මක කිරීම
2. මූලික ප්‍රතිපත්තිමය තීරණ ගැනීම
3. ව්‍යාපාරයට මූල්‍ය ප්‍රාග්ධනය යෙදවීම
4. ව්‍යාපාරයට අවශ්‍ය භෞතික සම්පත් සැපයීම

11) ව්‍යාපාරයක ඇල්මැති පාර්ශවයක් ලෙස මූල්‍ය ආයතනවල කාර්යයක් නොවනුයේ,

1. බදු පැනවීම
2. ණය සැපයීම
3. මූල්‍ය උපදෙස් ලබාදීම
4. කළමනාකරණ උපදෙස් ලබා දීම

12) පහත දැක්වෙන බලපෑම් අතුරින්, දේශීය ව්‍යාපාර මත ගෝලීය පරිසරයෙන් සිදුවන හිතකර බලපෑම තෝරන්න.

1. දේශීය භාණ්ඩ සඳහා වූ විදේශ වෙළඳපළ පුළුල් වීම
2. දේශීය ව්‍යාපාරවල පැවැත්ම ස්ථාවර වීම
3. දැඩි තරඟකාරී වෙළඳපළක් නිර්මාණය වීම
4. දේශීය පුහුණු ශ්‍රමය විදේශ රටවලට ඇදීයාම

13) ව්‍යාපාරයක අභ්‍යන්තර පරිසරය ඇගැයීම තුළින් අනාවරණය කර ගත හැක්කේ,

1. පාරිභෝගික මිලදී ගැනීම් රටාවේ වෙනස් වීම්
2. පුහුණු හා පළපුරුදු සේවකයන්ගේ හිඟය
3. රජය ව්‍යාපාරිකයන් වෙනුවෙන් හඳුන්වා දී ඇති අඩුපොළී යටතේ ණය ක්‍රම
4. ස්වාභාවික ආපදා

14) නව නගර නිර්මාණය කිරීම ව්‍යාපාරයක,

1. ශක්තියකි
2. දුර්වල තාවයකි
3. තර්ජනයකි
4. අවස්ථාවකි

15) ව්‍යාපාර සංවිධාන වර්ගීකරණයේදී යොදා ගනු නොලබන නිර්ණායක හඳුන්වන්න.

1. අරමුණු අනුව
2. සම්පත්වල ස්වාභාවය අනුව
3. හිමිකාරිත්වය අනුව
4. පරිමාණය අනුව

The National e-learning Portal for The General Education

51

## II කොටස

❖ ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.

1) අ.පො.ස. උසස් පෙළ විභාගය සමත් රවිඳු තම ආර්ථික දුෂ්කරතා නිසා ම උසස් අධ්‍යාපනයට යොමු නොවී පළතුරු අලෙවි කිරීමේ ව්‍යාපාරයක් ආරම්භ කිරීමට සිතයි. තම ගෙවත්තේ පළතුරු පමණක් මේ සඳහා ප්‍රමාණවත් නොවන නිසා තොග වශයෙන් ගෙන අලෙවිකිරීම සුදුසු බව ඔහුගේ මතයයි. මෑත කාලයේ විවිධ රසායන ද්‍රව්‍ය යොදා පළතුරු ඉදවීම නිසා ඒ සම්බන්ධයෙන් රජය අවධානය යොමුකර තිබේ.

i. ව්‍යාපාරයක් යනු කුමක් ද?
ii. රවිඳු විසින් පළතුරු අලෙවි කිරීමේ ව්‍යාපාරය ආරම්භ කිරීමේ ප්‍රධාන අරමුණු 2ක් ලියන්න.
iii. ඕනෑම ව්‍යාපාරයක තිබිය හැකි උප අරමුණු 2ක් දක්වන්න.
iv. නිෂ්පාදනය කරනු ලබන නිෂ්පාදනවල ස්වභාවය අනුව වර්ග කරන්නේ නම් මෙම ව්‍යාපාරය කුමන වර්ගයේ ව්‍යාපාරයක් ද?
v. රවිඳුගේ ව්‍යාපාරය ආරම්භ කිරීමට අත්‍යවශ්‍ය වන නිෂ්පාදන සාධක නම් කරන්න.
vi. මෙම ව්‍යාපාරයේ ඇල්මැති පාර්ශව 04ක් නම් කරන්න.
vii. ඔබ ඉහත නම්කළ ඇල්මැති පාර්ශව රවිඳුගේ ව්‍යාපාරය කෙරෙහි උනන්දුවක් දැක්වීමට හේතුව බැගින් සඳහන් කරන්න.
viii. රවිඳුගේ ව්‍යාපාරයේ බාහිර පරිසර සාධක 04ක් නම් කරන්න.

2) i. භාණ්ඩ හුවමාරු ක්‍රමය යනු කුමක් ද?
ii. පාරිභෝගික අවශ්‍යතා ලැයිස්තුගත කරන්න.
iii. පාරිබෝගික අවශ්‍යතා හා වුවමනා සසඳන්න
iv. පාසලක ඇල්මැති පාර්ශව 04ක් නම් කරන්න
v. පාසලක් තම ඇල්මැති පාර්ශව වලින් අපේක්ෂිත දායකත්වය වෙන් වෙන් වශයෙන් දක්වන්න.

3) i. ව්‍යාපාරයක අභ්‍යන්තර පරිසර සාධක නම් කරන්න.
ii. ව්‍යාපාරයකට එහි සැපයුම්කරුවන්ගේ වැදගත්කම කෙටියෙන් විස්තර කරන්න.
iii. ආර්ථික පරිසරයේ සාධක හතරක් නම් කර එකිනෙක කෙටියෙන් විස්තර කරන්න.
iv. ශ්‍රී ලංකාවේ ව්‍යාපාර සඳහා ගෝලීය පරිසරයෙන් සිදුවන හිතකර බලපෑම් 02ක් හා අහිතකර බලපෑම් 02 ක් නම් කරන්න.
v. ව්‍යාපාරයක ශක්තීන් හා දුර්වලතා හතර බැගින් නම් කරන්න.